පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපනය ලබමින් සිටි සිසුවෙකු, සැප්. 16, 2022 දින අතුරුදන් වීමත්, පසුව ඔහුගේ සිරුර හමුවීමත් සම්බන්ධයෙන් පොලිසිය විමර්ශන අරඹා තිබේ. මේ පිළිබඳව සමාජ මාධ්‍ය තුළත්, මාධ්‍ය තුළත් පුළුල් අවධානයක් ද යොමු වී තිබිණි.

මෙවැනි පුළුල් සමාජ අවධානයකට හසුවූ මරණයක් පිළිබඳව වාර්තා කිරීමේදී, උපකාරක අංක පළ කිරීම ඇතුළු විශේෂයෙන්ම දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් හඳුන්වා දි ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් තිරව අනුගමනය කිරීම, වගකීම් සහගත මාධ්‍යකරණයයි.

මන්ද යත්,

දිවි තොර කරගැනීමේ පිළිබඳව වන පුවත් වාර්තාවක් හා හදිසි උපකාරක අංක සඳහන් නොකිරීම ඔස්සේ, එය කියවන දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු ඉන් වළකා උපදේශනයට යොමු කිරීමේ අවස්ථාවක් මග හැරී යෑම විය හැක.

දිවි තොර කරගැනීමේ අරමුණින් ලියූ බවට පෙනෙනා ලිපියක් හෝ එහි කොටස් මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීම ඔස්සේත්, එසේම දිවි තොර කරගත් අයගේ ඡායාරූප පළ කිරීම ඔස්සේත්, දිවි තොර කරගැනීමේ නැඹුරුවෙන් යුතු අයෙකු එය තමන් හා අනන්‍ය කරගැනීමත්, එය අනුකාරක සිදුවීමකට ඉඩ සැලැස්වීමත් සිදුවිය හැක.

ඒ අනුව, මෙම පුවත් වාර්තාවන් සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් වන්නේ ද? මෙම එක් පුවත් වාර්තාවක් සමගින් හෝ හදිසි උපකාරක අංක පළ වී නොමැත්තේ මන්ද?

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...